*සැ. යු.* - (i) 2014.05.16 වැනි දින පළ වූ අංක 1863 දරන *ගැසට් පත්‍රයේ* I : III කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන්ගේ නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,864 - 2014 මැයි මස 23 වැනි සිකුරාදා - 2014.05.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 406 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 406 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 407 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - සංසමිත්තා ශ්‍රද්ධාකර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2014 මැයි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජූනි මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මැයි මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

405– B 080841—300 (2014/05)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

නිවැරදි කිරීමයි

DIRF/RECT/277/AY (1).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම

2014.03.28 වැනි දින අංක 1856 දරන *ගැසට් පත්‍රයේ* I කොටස : I ඡෙදය යටතේ පළකරන ලද නිවේදනයේ පහත නම සඳහන් අයගේ නම නිවැරදි විය යුතු ය.

"පහත නම් සඳහන් ගණක නිලධාරි 2012.10.25 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බලසේනාවේ ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එදින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

2012.10.25 වැනි දින සිට ලුතිතන් නිලය :

නැකත්ගෙදර බුද්ධික යුරේෂ් කුමාර ධර්මසේන "

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 16 වැනි දින,
කොළඹ දී ය.

05-862

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/05/2013/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.05.23 වැනි දින සිට 2014.06.06 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධතාවයක් ප්‍රකශ කර සිටීමට කමැති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.06.13 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක. 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ දරන කොට්ඨාසයේ 375 වෙළුමේ 213 පත් ඉරුව | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ මුත්වල් වීදිය වරි. අංක 42, 46, (කොටසක්), 46/1, මුත්වල් පිහිටි ඉඩමට එස්. රාජේන්ද්‍ර බලයලත් මානක තැන විසින් 1957.04.08 දින මැන සාදන ලද අංක 1093 පිඹුර ප්‍රකාර මායිම්, | 01. සී. එම්. චින්නයියා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1957.05.28 දින අංක 993 දරන විකුණුම්කරය.<br><br>02. කේ. රාසනාතන් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1957.10.15 දින අංක 2689 |

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
| --- | --- | --- |
| | උතුරු නැගෙනහිර : වරි. අංක 46 (කොටසක්) 50 සහ 52(1-2) සහ වරි. අංක 74 දරන පල්ලිගේ ගොඩනැගිලි සහ වරි. අංක ජී 74 මුත්වල් වීදිය ; දකුණු නැගෙනහිර : එලී හවුස් පාර්ක් ; දකුණු බටහිර : වරි. අංක ජී 36 සහ 40 මුත්වල් වීදිය ; බස්නාහිර : මුත්වල් වීදිය ප්‍රමාණය : අ. 0, රූ. 01, පර්. 38.87 | දරන උකස්කරය. 03. එස්. සෝමසුන්දරම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1959.04.03 දින අංක 7725 දරන විකුණුම්කරය. 04. කේ. පී. ජෙගදීසන් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1986.02.09 දින අංක 1803 දරන අද්මිනිස්ත්‍රාසිකාර බලකරය. |

05-702

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - මූලස්ථාන ශාඛාව

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.03.28 දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එන්. පෙරේරා මහත්මිය විසින් සහතික කරන ලද 2011.03.04 දින අංක 4248 දරන උකස් බැඳුම්කරය මත ද, මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියන්ති ලියනගේ මහත්මිය විසින් සහතික කරන ලද 2011.01.10 දින අංක 5379 දරන උකස් බැඳුම්කරය මත ද, 2012.12.05 දින අංක 5832 දරන උකස් බැඳුම්කරය මත ද, 2013.08.13 දින අංක 5997 දරන උකස් බැඳුම්කරය මත ද අයවිය යුතු මුදල් ගෙවීම, කන්දෙආරච්චිගේ සමන්ත පෙරේරා සහ ආතාවූ ද ආරච්චිගේ භාග්‍යා ශ්‍රී මධුමාලි ජයතිස්ස සහ දෙහිවල අත්තිඩිය, ගැමුණු මාවතේ, අංක 2/6 දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තා වූ ද, 2007 අංක 07 දරන පනත යටතේ සමාගමක් වශයෙන් යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ලියාපදිංචි අංක පී. වී. 18065 දරන ඔලක්මෝ ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 4248, 5379, 5832 සහ 5997 දරන උකස් බැඳුම්කර මත දැනට මහජන බැංකුව වෙත රුපියල් මිලියන තිස්හතයි එක්ලක්ෂ දාහතර දහස් හයසිය අසූ දෙකයි ශත හැත්තෑ එකක් වූ (රු.37,114,682.71) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩුකිරීමෙන් පසුව සහ වෙනත් විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමග 2014.01.30 දින සිට වෙන්දේසි දිනය දක්වා (1) රුපියල් මිලියන දොළහයි එක්ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස් තුනයි ශත හතළිස් හතරක් (රු.12,133,333.44) වූ මුදලක් මත වර්ෂයකට 14.94% තවදුරටත් වූ පොළියක් ද, (2) රුපියල් මිලියන හයයි පන්ලක්ෂ හැට එක් දහස් නවසිය හතරයි ශත අසූ අටක් වූ (රු.6,561,904.88) මුදලක් මත වර්ෂයකට 13.94% ක තවදුරටත් වූ පොළියක් ද, (3) රුපියල් මිලියන තුනයි හයලක්ෂ එකොළොස් දහස් එකසිය එකොළොහයි ශත විස්සක් වූ (රු.3,611,111.20) මුදලක් මත වර්ෂයකට 11.86% ක තවදුරටත් වූ පොළියක් ද, (4) රුපියල් මිලියන එකයි අටලක්ෂ තිස් හත්දහස් පන්සියයයි ශත පහක් වූ (රු.1,837,500.05) මුදලක් මත වර්ෂයකට 17.5% ක තවදුරටත් වූ පොළියක් ද, (5) රුපියල් මිලියන එකයි හාරලක්ෂ විසි එක් දහසක් (රු.1,421,000) වූ මුදලක් මත වර්ෂයකට 18% ක තවදුරටත් වූ පොළියක් ද, (6) රුපියල් මිලියන එකයි තුන් ලක්ෂ අසූ එක් දහස් එකසිය අනූපහයි ශත පනස් පහක් වූ (රු.1,381,195.55) මුදලක් මත වර්ෂයකට 18% ක තවදුරටත් වූ පොළියක් ද (7) රුපියල් මිලියන එකයි හැත්තහය දහසක් (රු.1,076,000) වූ මුදලක් මත වර්ෂයකට 17.5% ක තවදුරටත් වූ පොළියක් ද, (8) රුපියල් දෙලක්ෂ හැත්තෑ දෙදහසක් (රු.2,72,000) වූ මුදලක් මත වර්ෂයකට 17.5% ක තවදුරටත් වූ පොළියක් ද, (9) රුපියල් අටලක්ෂ පනස් හය දහසක් (රු.8,56,000) වු මුදලක් මත වර්ෂයකට 16.0% ක තවදුරටත් වූ පොළියක් ද, (10) රුපියල් පන්ලක්ෂ අසූහත් දහසක් (රු.5,87,000) වූ මුදලක් මත වර්ෂයකට 17.5% ක තවදුරටත් වූ පොළියක් ද සහ (11) රුපියල් මිලියන හයක් වූ මුදලක් මත (රු.6,000,000) වර්ෂයකට 19.5% ක තවදුරටත් වූ පොළියක් ද සමග රුපියල් මිලියන තිස්හතයි එක්ලක්ෂ දාහතර දහස් හයසිය අසූ දෙකයි ශත හැත්තෑ එකක් වූ (රු.37,114,682.71) මුදලක් අයකර ගැනීම සඳහා ඉහත කී අංක 4248, 5379, 5832, සහ 5997 දරන උකස් බැඳුම්කර මගින් ඉහත කී බැංකුව වෙත උකස් කරන ලද දේපල සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර අර්විස් පෙරේරා මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය

(1) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 543 B, දකුණු අත්තිඩිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අත්තිඩියේ පිහිටා ඇත්තා වූ ද, "තෙලෙඹුගහවත්ත සහ කිවුලේඹිවිට" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු බී. ජී. පී. අබේනායක විසින් සාදන ලද 2000.09.18 දින අංක 2965 දරන පිඹුරේ ලොට් 'C' ලෙස ලකුණු කර ඇත්තා වූ ද, උතුරට : ගැමුණු මාවතේ වරිපනම් අංක 09 හා අංක 1434 දරන පිඹුරේ ලොට් 'B' ද, නැගෙනහිරට : ලොට් 'C' 2 ද, දකුණට : ගැමුණු මාවත ද, බටහිරට : අංක 1434 දරන පිඹුරේ ලොට් 'D' ද යන මායිම් තුල පිහිටා ඇත්තා වූ ද, දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ F9/126 යටතේ ලියාපදිංචි වී ඇති පර්චස් එකොළහයි දශම තුනයි එකයි

පහක් වූ ( A0, R0, P11.315) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද වේ.

(2) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලෙ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 543 උතුරු අත්තිඩිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ උතුරු අත්තිඩිය 21 වන කොට්ඨාසයේ පිහිටා ඇත්තා වූ ද, "දෙල්ගහහේන" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ගාමිණී. බී. දොඩන්වෙල විසින් සාදන ලද 2005.05.17 දින අංක 5494 දරන පිඹුරේ ලොට් අංක "1" ලෙස ලකුණු කර ඇත්තා වූ ද, උතුරට : ටී. එම්. එම්. එල්. තෙන්නකෝන් සහ ඉන්දික සමරරත්න විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ මීටර් හයක් පළල මාර්ගය ද, නැගෙනහිරට : ඉන්දික සමරරත්න විසින් හිමිකම් කියන ඉඩම, මීටර් හයක් පළල මාර්ගය සහ බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්. අබේසිංහ විසින් සාදන ලද අංක 2619 දරන පිඹුරේ ලොට් අංක 8 ද, දකුණට : කේ. අනුර පත්මකුමාර විසින් හිමිකම් කියන ඉඩම ද, බටහිරට අංක 1528 දරන පිඹුරේ ලොට් අංක 8 (අංක 1528 පිඹුරේ ලොට් අංක 1) අංක 1528 දරන පිඹුරේ ලොට් අංක 7 සහ ටී. එම්. එම්. කේ. තෙන්නකෝන් විසින් හිමිකම් කියන ඉඩම ද, යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ F9/127 යටතේ ලියාපදිංචි වී ඇති ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දොළහයි දශම එකයි බිංදුවක් (අක්. 0, රූ. 1, පර්. 12.10) හෙවත් හෙක්ටයාර් 0.1318 ක් වූ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද වේ.

කළාප කළමනාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකුව,
කළාප ප්‍රධාන කාර්යාලය (බස්නාහිර කලාපය - 01)
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

05-695

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 920423 සහ 1392239
ඒ. එස්. ආර්. වෙජිටබල් ඔයිල් කම්ප්ලේක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2014 පෙබරවාරි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. එන්. ද සිල්වා විසින් 2011 මැයි 26 වැනි දින සහතික කරන ලද අංක 3523 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පුත්තලම ස්පිල් පාරේ අංක 14 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වූ ඒ. එස්. ආර්. වෙජිටබල් ඔයිල් කම්ප්ලේක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හයකෝටි හැත්තෑහත්ලක්ෂ එක්දහස් එකසිය තුනයි ශත පනස් හත (රු. 67,701,103.57) ක මුදලක් 2014 ජනවාරි මස 28 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී හයකෝටි හැත්තෑහත්ලක්ෂ එක්දහස් එකසිය තුනයි ශත පනස් හතක (රු. 67,701,103.57) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 ජනවාරි 29 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 58,500,000 ක මුදල මත 22% වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ද ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩු කොට එකී අංක 3523 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට උකස් කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍ර කොළඹ 12 හල්ස්ඩොෆ් වීදියේ අංක 182 හි 3 වැනි මහලේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබයි.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ උතුරු පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා නගර සභා සීමාවේ ආරච්චිවිල්ලු ගමේ බගුස් ටෝට්ම් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. තෙවේන්ද්‍රන් විසින් 1998 ජූලි 15 වැනි දින සාදන ලද පිඹුරු අංක 2644 හි ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : බසීර්ට අයිති ඉඩම ද, නැගෙනහිරට : බෙන්ජා අබ්දුල් හමීඩ් නච්චියා සහ තවත් අය හිමිකම් කියන ඉඩම ද දකුණට : (H) දරන පාර ද සහ බස්නාහිරට : වී. සී. පාරෙන් ද මායිම් වූ එකී අංක 2644 දරන පිඹුරු ප්‍රකාරව අක්කර පහළොවයි රූඩ් එකයි පර්චස් තිස්එක (අ. 15 රූ. 1 පර්. 31) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු එෆ් 151/101 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම නැවත මැනීමකින් පසු පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ උතුරු පුත්තලම කඩවත් තුළ පුත්තලම නගරයේ ආරච්චිවිල්ලු ගමේ පිහිටි බගුස් ටෝට්ම් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් විසින් 2007 ජනවාරි මස 15 වැනි දින සාදන ලද පිඹුරු අංක 3017 Aහි ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : බසීර්ට අයිති ඉඩම ද, නැගෙනහිරට : අබ්දුල් හමීඩ් නච්චියා සහ තවත් අය හිමිකම් කියන ඉඩම ද, දකුණට : (ආර්ඩීඒ) පාර ද, සහ බස්නාහිරට : (පීඑස්) පාරෙන් ද මායිම් වූ එකී අංක 3017 A පිඹුරට අනුව විශාලත්වයෙන් අක්කර පහළොවයි රූඩ් එකයි පර්චස් තිස්එකක් (අ. 15 රූ. 1 පර්. 31) වේ.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

05-683

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 පනත් මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ඩබ්ලිව්. එම්. එෆ්. බී. ටී. පීරිස්.
ගිණුම් අංක : 0108 5000 1915.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ක් වූ අප්‍රේල් මස 30 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. ඩී. සුබසිංහ යන අය විසින් ලියා සහතික කරන ලද 2012 අගෝස්තු මස 24 දාතම හා අංක 894 සහ 896 දරන උකස් බැඳුම්කර දෙක සහ 2013 පෙබරවාරි 13 දාතම හා අංක 1128 සහ 1130 දරන උකස් බැඳුම්කර දෙක යන සියල්ලම මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වර්ණකුලසූරිය මහතෙල්ගේ ෆෑන්ක් බැප්ටිස් ටෝනි පීරිස් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී 894, 896, 1128 සහ 1130 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තුන්කෝටි අනූනය ලක්ෂ නම දහස් එකසිය පහළොවයි ශත හැත්තෑ නමයක (රු. 39,609,115.79) මුදලක් 2014 අප්‍රේල් මස 01 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තුන්කෝටි අනූනය ලක්ෂ නම දහස් එකසිය පහළොවයි ශත හැත්තෑ නමයක (රු. 39,609,115.79) මුදල ද 2014 අප්‍රේල් මස 02 දින සිට අංක 894, 896, 1128 සහ 1130 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන්කෝටි හැටතුන් ලක්ෂ හැත්තෑ දහසක (රු. 36,370,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 894, 896, 1128 සහ 1130 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ නගර සභා සීමාවන් තුළ උතුරු පිටිගල් කෝරළේ, අනායිවිලුන්දන් පත්තුවේ සී ස්ට්‍රීට් වෝඩ් අංක 10 ෂර්ලි කොරයා ඇවනිව් පිහිටි කොරයා මාවත වරිපනම් අංක 43 දරන "අලබක්කන්ගල" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ශ්‍රීතරන් යන අය විසින් සාදන ලද 2009 මැයි මස 21 දාතම හා අංක 4140 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : "ෂර්ලි කොරයා ඇවනිව්" දිගේ වෙන් කිරීම සහ බලයලත් මානක තැන , එම්. එම්. පී. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද අංක 3850 දරන පිඹුරේ ලොට් E, නැගෙනහිරට : බලයලත් මානක තැන එම්. එම්. පී. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද අංක 3850 දරන පිඹුරේ ලොට් E, පොලිකා ලෝවේගේ උරුමක්කාරයින්ගේ ඉඩම සහ මර්වින් තිසේරා යන අයගේ ඉඩම, දකුණට : මැගිලින් ප්‍රානන්දු යන අයගේ ඉඩම සහ බස්නාහිරට : කැෂ්මියර් ප්‍රනාන්දු සහ එස් ලෝගනාතන් යන අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම තුනයි එකක් (අ. 0, රූ. 0, පර්. 11.31) හෝ හෙක්ටයාර් 0.0286ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 4141 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී අනායිවිලුන්දන් පත්තුවේ සී ස්ට්‍රීට් (කොරයා ඇවනිව්) පිහිටි "අලබක්කන්ගල" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම් එම්. පී. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 1995 සැප්තැම්බර් මස 18 දාතම හා අංක 1743 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 සහ 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කොරයා ඇවනිව් සහ ලොට් E, නැගෙනහිරට : ලොට් E, පොලිකා ලෝවේගේ උරුමක්කාරයින්ගේ ඉඩම සහ මර්වින් තිසේරා යන අයගේ ඉඩම, දකුණට : මැගිලින් ප්‍රානන්දු යන අයගේ ඉඩම සහ බස්නාහිරට : කැෂ්මියර් ප්‍රනාන්දු සහ එස්. ලෝගනාතන් යන අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම තුනයි එකක් (අ. 0, රූ. 0, පර්. 11.31) හෝ හෙක්ටයාර් 0.286ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 1743 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A07/104 යටතේ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බැඳුම්කර අංක 894 සහ 2128 ප්‍රකාර සහ ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත සහ තිඹිල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සහ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ නගර සභා සීමාවන් තුළ උතුරු පිටිගල් කෝරළේ, අනායිවිලුන්දන් පත්තුවේ තිඹිල්ල පිහිටි "මීගෙල් වගාකල ඉඩම, සදාර් වයාල් නොහොත් නෙරුප්පන්ඩ්මුල්ල, පානියවැලි කුලම් වයාල් සහ අක්කරයෙන්කොටුව" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. බාලෙන්දිරන් යන අය විසින් සාදන ලද 2012 අගෝස්තු 16 දාතම හා අංක 2012/03/67 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : පාර (අඩි 12 පළල), ගිණිකොනට : ජේ. ෆයිස්ඩීන් යන අයගේ ඉඩම, නිරිතට : පාර (අඩි 12 පළල) සහ වයඹට : පාර (හලාවත සිට පුත්තලම දක්වා) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහඅටක් (අ. 0, රූ. 0, පර්. 18) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතින් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 2012/3/67 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී තිඹිල්ල පිහිටි "මීගෙන් වගාකළ ඉඩම, සදාර් වයාල් නොහොත් නෙරුප්පන්ඩ්මුල්ල, පානියවැලි කුලම් වයාල් සහ අක්කරයෙන්කොටුව" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වර්නන් පෙරේරා යන

අය විසින් සාදන ලද 1987 සැප්තැම්බර් මස 17 දාතම හා අංක 6065 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : පාර (හලාවත සිට පුත්තලම දක්වා) නමුත් වඩා නිවැරදිව මෙහි ලොට් 09, ගිණිකොණට : ලොට් 9 නමුත් වඩා නිවැරදිව මෙහි ලොට 3, නිරිතට : ලොට් 3 නමුත් වඩා නිවැරදිව රූපසිංහ සහ සහෝදරියගේ උරුමක්කාරයින්ගේ ඉඩම සහ වයඹට : රූපසිංහ සහ සහෝදරියගේ උරුමක්කාරයිනගේ ඉඩම නමුත් වඩා නිවැරදිව පාර (හලාවත සිට පුත්තලම දක්වා) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (අ. 0. රූ. 0, පර්. 18) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 6065 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A07/17 යටතේ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බැඳුම්කර අංක 896 සහ 1130 ප්‍රකාර සහ ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

05-727

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

පී. ඒ. ජී. එන්. ආර්. කුලරත්න.
ගිණුම් අංක : 0154 5000 1144.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ක් වූ අප්‍රේල් මස 30 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. එස්. කල්හාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2013 මැයි මස 14 දාතම හා අංක 184 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජේලි ආරච්චිලාගේ ගර්ලි නිශාන්ත රනිල් කුලරත්න යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 184 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් පනස් හය ලක්ෂ හාර දහස් තුන්සිය පනස් නමයයි ශත පහළොවක (රු. 5,604,359.15) මුදලක් 2014 මාර්තු මස 27 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පනස් හය ලක්ෂ හාර දහස් තුන්සිය පනස් නමයයි ශත පහළොවක (රු. 5,604,359.15) මුදල ද 2014 මාර්තු මස 28 දින සිට අංක 184 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් නම ලක්ෂ හැත්තෑ දෙදහස් පන්සීයක (රු. 4,972,500) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 184 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ, තමන්කඩුව කෝරළේ, තමන්කඩුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ උඩවෙලගම 124 ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ, උඩුවෙලගම ග්‍රාමයේ පිහිටි ඉඩමට බලයලත් මානක තැන අයි. කොටඹගේ යන අය විසින් සාදන ලද 2005 දෙසැම්බර් මස 24 දාතම හා අංක 1466 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 90/03 දරන පිඹුරේ ලොට් 02, නැගෙනහිරට : පාර සඳහා වෙන් කිරීම, දකුණට : අංක 90/03 දරන පිඹුරේ ලොට් 04 සහ බස්නාහිරට : ලොට් FCP115 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) හෝ හෙක්ටයාර් 0.2024ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ එහ් පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 1466 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව LDO B/5/92 යටතේ පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

05-726

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2013 නොවැම්බර් මස 27 වැනි දින ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. බී. සී. ගුණතිලක විසින් ලියා සහතික කරන ලද අංක 5629 හා 2012 ජූලි 04 දින දරන උකස් බැඳුම්කරය මත, අයවිය යුතු මුදල් ගෙවීම්, බත්තරමුල්ල, වික්‍රමසිංහපුර, අංක 22/2 දරන ස්ථානයේ දෙදෙනාම

පදිංචි ශාන්ත ආරච්චිගේ ප්‍රියන්ත සුමිත් ජයසිංහ සහ ශාන්ත ආරච්චිගේ ජයසිංහ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2013 අගෝස්තු මස 31 වැනි දිනට එකී ශාන්ත ආරච්චිගේ ප්‍රියන්ත සුමිත් ජයසිංහ සහ ශාන්ත ආරච්චිගේ ජයසිංහ යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හැටපන් ලක්ෂ පනස් තුන් දහස් නවසිය තිස්හතකුත් ශත හතලිස් හයක (රු. 65,53,937.46) මුදලක් සහ 2013 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පනස් හයලක්ෂ හාරදහස් දෙසීය එකොළහකුත් ශත හැත්තෑ නවයක් (රු. 56,04,211.79) සඳහා එක් එක් මාසයේ ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක ණය පොලී අනුපාතියකට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතියක මත පොළිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හැටපන් ලක්ෂ පනස් තුන් දහස් නවසිය තිස්හතකුත් ශත හතලිස් හයක (රු. 65,53,937.46) මුදලක් සහ 2013 සැප්තැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පනස් හයලක්ෂ හාරදහස් දෙසීය එකොළහකුත් ශත හැත්තෑ නවයක් (රු. 56,04,211.79) සඳහා එක් එක් මාසයේ ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක ණය පොළී අනුපාතියකට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතියක මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 5629 දරන උකස් බැඳුම්කරය මගින් ඉහත කී ශාන්ත ආරච්චිගේ ජයසිංහ විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය එහි පිහිටි ගොඩනැගිලි ද සමග කොළඹ ෂොක්මන් සහ සමරවික්‍රම බලයලත් වෙන්දේසිකරුවන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 5629 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත දකුණු තලංගම පිහිටි "සෙන්ට් තෝමස් එස්ටේට්" යනුවෙන් හැඳින්වෙන ඉඩමේ බලයලත් මානක ඩී. ටී. එම්. නානායක්කාර මැන සකස් කළ අංක 1083 හා 1996.05.10 දින දරන පිඹුරේ ලොට් අංක 94 ලකුණු කළ බිම් කට්ටියට වන උතුරට : ලොට් අංක 95 ද, නැගෙනහිරට : ලොට් අංක 86 ද, දකුණට : ලොට් අංක 93 ද, බස්නාහිරට : ලොට් අංක 108 ද යන මායිම් ඇතුළත පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි හා එයට අනුබද්ධ වෙනත් සියලු දේ. මෙම ඉඩම හෝමාගම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

බලයලත් මානක ඩී. ආර්. ආර්. පී. ජයසූරිය මැන සකස් කළ අංක 1988 හා 2005.05.08 දින දරන පිඹුරට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත දකුණු තලංගම පිහිටි "සෙන්ට් තෝමස් එස්ටේට්" යනුවෙන් හැඳින්වෙන ඉඩමෙන් ඉහත සඳහන් අංක 1988 දරන පිඹුරේ නිරූපිත ලොට් 94A ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වන, වික්‍රමසිංහපුර 1 වැනි පටුමඟ, වරිපනම් අංක 22/1A, 22/1A1 සහ 22/2 දරන ගොඩනැගිලි සහිත ඉඩම වන උතුරට : එම්. ඒ. මිල්ලගස්තැන්නේට අයිති (අංක 1083 පිඹුරේ ලොට් අංක 95 දරන) ඉඩම ද, නැගෙනහිරට : යූ. ආර්. සෝරසිංහට අයිති (අංක 1083 පිඹුරේ ලොට් අංක 86 දරන) ඉඩම ද, දකුණට : සී. ඒ. චිත්‍රා මාලිනීට අයිති (අංක 1083 පිඹුරේ ලොට් අංක 93 දරන) ඉඩම ද යන මායිම් ඇතුළත පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි හා එයට අනුබද්ධ වෙනත් සියලු දේ. මෙම ඉඩම හෝමාගම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

05-719

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2013 ඔක්තෝබර් මස 30 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ජයසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 317 සහ 2004 අගෝස්තු 5 වැනි දින දරන උකස් බැඳුම්කර ය මත සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. පී. කොඩිතුවක්කු ලියා සහතික කරන ලද අංක 625 සහ 2008 සැප්තැම්බර් 23 දින ද අංක 691 සහ 2009 අප්‍රේල් 07 දින ද දරන උකස් බැඳුම්කර දෙක මත අයවිය යුතු මුදල් ගෙවීම්, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ/1938 අංක 51 දරන සමාගම් ආඥාපනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තාවූ ද ලියාපදිංචි කාර්යාලය කොළඹ 2, යූනියන් පෙදෙස, ඩෝසන් වීදිය, ඔරියන්ට් බිල්ඩිං අංක 74 2/2 දෙවන මහල යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද සමාගමක් වන (මෙහි මින් ඉදිරියට " එකී සමාගම" යනුවෙන් සඳහන් කරන) "ඔටෝමේටඩ් බාර්කෝඩ් සොලියුෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්'' සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2013 අගෝස්තු 31 වැනි දිනට ඉහත කී අංක 317, 625 හා 691 දරන උකස් බැඳුම්කර මත, එකී ඔටෝමේටඩ් බාර්කෝඩ් සොලියුෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එක්කෝටි

විසිදෙලක්ෂ හැටතුන් දහස් එකසිය අනූහයක (රු. 1,22,63,196) මුදලක් සහ 2013 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්ලක්ෂ හැත්තෑඑක් දහස් අටසිය හතලිස් දෙකක් (රු. 1,71,842) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන සති දොළහේ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහල අනුපාතිකයක් මත පොළිය ද, රුපියල් අසූහය ලක්ෂ දහසය දහස් හයසිය හැටපහක් (රු. 86,16,665) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ;

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේදී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට සියයට හතකුත් දශම පහක (7.5%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද, රුපියල් විසිලක්ෂ විසිඑක් දහස් පන්සිය විසි එකකුත් දශම අනූහයක් (රු. 20,21,521.96) සඳහා එක් එක් වර්ෂයේ සෑම මාසයකම ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට වර්ෂයකට සියයට හතරක් (4%) ඉහළ අනුපාතිකයක් මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් එක්කෝටි විසිදෙලක්ෂ හැටතුන් දහස් එකසිය අනූහයක (රු. 1,22,63,196) මුදලක් සහ 2013 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්ලක්ෂ හැත්තෑඑක් දහස් අටසිය හතලිස් දෙකක් (රු. 1,71,842) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරත් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන සති දොළහේ මධ්‍යක මූලික ණය පොලි අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහල අනුපාතිකයක් මත පොළිය ද, රුපියල් අසූහය ලක්ෂ දහසය දහස් හයසිය හැටපහක් (රු. 86,16,665) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන මෙහි පහත දැක්වෙන පාදක පොළි අනුපාතික අතරින්, එනම් :

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ;

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ;

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේදී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට වර්ෂයකට සියයට හතකුත් දශම පහක (7.5%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද රුපියල් විසිලක්ෂ විසිඑක් දහස් පන්සිය විසි එකකුත් ශත අනූහයක් (රු. 20,21,521.96) සඳහා එක් එක් වර්ෂයේ සෑම මාසයකම ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට වර්ෂයකට සියයට හතරක් (4%) ඉහල අනුපාතිකයක් මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 317, 625 හා 691 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා එකී ඔටෝමේටඩ් බාර්කෝඩ් සොලියුෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම සඳහා සහ වෙනුවෙන් එම සමාගමේ අධ්‍යක්ෂවරයකු වන අග්බෝ සිරිනාග බුළුමුල්ල යන අය විසින්, ඉහත සඳහන් අංක 317, 625 හා 691 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර තිබෙන මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 317 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟවෙල කෝරළේ, හන්තානේ පිහිටි "මවුන්ට් ප්ලසන්ට් එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. බී. ඩී. වැත්තෑව මැන සකස් කළ අංක 1713 හා 1995 මැයි මස 24 දින දරන පිඹුරේ ලොට් අංක 71 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ඕය ද, නැගෙනහිරට : ලොට් අංක 73 ද, දකුණට : ලොට් අංක 76 ද, බස්නාහිරට : ලොට් අංක 76 ද යන මායිම් ඇතුළත එකී අංක 1713 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිහකුත් දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 30.75) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මෙයට ඉහත සඳහන් අංක 1713 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 76 ඔස්සේ මාර්ග අයිතිය ද ඇතුළත් ය.

**අංක 625 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උතුරු මාතලේ, වගපනහ පල්ලෙසිය පත්තුවේ, තිත්තවැල්ගොල්ල සහ බින්තඹුරේ පිහිටි "තිත්තවැල්ගොල්ල එස්ටේට්" නමැති ඉඩමේ කොටස් වන (බලයලත් මිනින්දෝරු කේ. කුමාරසාමි විසින් මැන සකස් කරන ලද අංක 7166 හා 1976 සැප්තැම්බර් 10 දින දරන පිඹුරේ ලොට් අංක 3, 5, 7, 2 යන බිම් කට්ටි සහ ලොට් අංක 1, 4, 6 හා 9 දරන බිම් කට්ටිවලින් කොටස් නැවත මැනීමක් වූ) බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. ඩයස් විසින් මැන සකස් කළ අංක 1389 හා 2007 ජූලි 22-23 දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන්කල ඉඩමට මායිම්, උතුරට : ඒ. ආර්. ජයසිංහ සහ ඒ. ආර් කරුණාතිලක හිමිකම් කියන මෙම ඉඩමේ කොටස් ද, ඒ. එස්. බුළුමුල්ල හිමිකම් කියන මෙම ඉඩමේ කොටස් ද, ජයරත්න හිමිකම් කියන මෙම ඉඩමේ කොටස් ද, නැගෙනහිරට : ජයරත්න හිමිකම් කියන මෙම ඉඩමේ කොටස්, දිසානායක හිමිකම් කියන මෙම ඉඩමේ කොටස්, ඒ. එස්. බුළුමුල්ල කොටසකට හිමිකම් කියන සහ කොටසක දිසානායක පදිංචි, බලයලත් මිනින්දෝරු කේ. කුමාරස්වාමි මැන සකස් කළ අංක 7166 දරන පිඹුරේ ලොට් 6, මෙම ඉඩමේ කොටසක් සහ වැව් ඉවුර සඳහා රිසවේසම ප්‍රවේශ මාර්ගය සහ වැව් ඉවුරේ රිසවේසම ද, දකුණට : ඒ. එස්. බුළුමුල්ල හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක්, ඩී. එම්. සිරිසේන සහ තවත් අය හිමිකම් කියන මෙම ඉඩමේ කුඹුරු කොටස, අංක 7166 පිඹුරේ ලොට් අංක 8 බිම් කට්ටියෙන් ඒ. එස්. බුළුමුල්ල හිමිකම් කියන

කොටසක් සහ බස්නාහිරට : ඩබ්ලිව්. එම්. විජේකෝන්, ඩී. එම්. සිරිසේන සහ තවත් අය හිමිකම් කියන මෙම ඉඩමේ කුඹුරු කොටස සහ වික්‍රමසිංහ හා කේ. බී. විජේකෝන් හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් යන මායිම් ඇතුළත අක්කර දහනවයකුත් රූඩ් තුනකුත් පර්චස් විසි දෙකක් (අ. 19, රූ. 3, පර්. 22) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

**අංක 691 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා බලප්‍රදේශය ඇතුළත, වට්ටාරන්තැන්න ග්‍රාමයේ පිහිටි "වට්ටාරන්තැන්න එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඒ. ද සී. විජේතුංග විසින් මැන සකස් කරන ලද අංක 4727 හා 1961 ජනවාරි මස 08 වැනි දින දරන පිඹුරේ දැක්වෙන, වට්ටාරන්තැන්න පැසේජ් වරිපනම් අංක 88/4 දරන බෙදා වෙන් කළ බිම් කොටස වූ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : ඩබ්ලිව්. වික්‍රමසිංහට අයිති දේපළ ද, දකුණට : පාර සහ බස්නාහිරට : ආර්. බී. නුගේගොඩට අයිති දේපළ ද, යන මායිම් ඇතුළත එකී අංක 4727 දරන පිඹුර ප්‍රාකර පර්චස් තිස්දෙකක් (අ. 0, රූ. 0, පර්. 32) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. ඩයස් විසින් මෑතකදී මැන සකස් කළ අංක 1744 හා 2009 මාර්තු මස 08 දින දරන පිඹුරට අනුව ඉහත දැක්වෙන ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා බලප්‍රදේශය ඇතුළත, වට්ටාරන්තැන්න ග්‍රාමයේ පිහිටි "වට්ටාරන්තැන්න එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඒ. ද සී. විජේතුංග විසින් මැන සකස් කරන ලද අංක 4727 හා 1961 ජනවාරි මස 08 වැනි දින දරන පිඹුරේ දැක්වෙන, වට්ටාරන්තැන්න පැසේජ් වරිපනම් අංක 88/4 දරන ඉඩම නැවත මැනීමක් වන බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. ඩයස් මැන සකස් කළ අංක 1744 හා 2009 මාර්තු 08 දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : ප්‍රවේශ මාර්ගය සහ යටිගම්මන හිමිකම් කියන ඉඩම ද, දකුණට : යටිගම්මන පදිංචි ඉඩම සහ බස්නාහිරට : එන්. එස්. කේ. වැරැල්ලගම හිමිකම් කියන ඉඩම ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 1744 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිස්දෙකක් (අ. 0, රූ 0, පර්. 32) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 02.

05-720

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2013 නොවැම්බර් මස 27 දින දී ඒක ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට ත්‍රිකුණාමලයේ ප්‍රසිද්ධ නොතාරිස් තිලගරත්නම් තුශ්යාන්තම් විසින් ලියා සහතික කරන ලද අංක 843 හා 2011 ජනවාරි 13 වැනි දින ද, අංක 1516 හා 2012 මාර්තු 30 දින ද, අංක 1747 හා 2012 අගෝස්තු 21 දින ද දරන සියලු උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම්, "විග්මන් එන්ටප්‍රයිසස් " යන නාමය අභිධානය සහ ආයතනය යටතේ ත්‍රිකුණාමලය මහ වීදිය, (මේන් ස්ට්‍රීට්) අංක 329 දරන ස්ථානයේ ව්‍යාපාරය කරගෙන යන ෂන්මුගම් විග්නේස්වරන් යන අය පැහැර හැර ඇති හෙයින් ද,

2013 සැප්තැම්බර් 30 වැනි දිනට එකී ෂන්මුගම් විග්නේස්වරන් යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එක්කෝටි විසිඅට ලක්ෂ හැත්තෑ දහස් තුන්සිය විසි අටකුත් ශත පනස් හතරක (රු. 1,28,70,328.54) මුදලක් සහ 2013 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පනස් හයලක්ෂ අනූනව දහස් නවසිය හැත්තෑ අටක් (රු. 56,99,978 ) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන, මෙහි පහත විස්තර දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ;

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

මත පොළිය ද රුපියල් විසිපන් ලක්ෂ හැට අට දහස් දෙසිය අනූදෙකක් (රු. 25,68,292) සඳහා එක් එක් මාසයේ ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක ණය පොලි අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට නවයක් (9%) ඉහල අනුපාතියක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද රුපියල් තිස්පන් ලක්ෂයක් (රු. 35,00,000) සඳහා එක් එක් මාසයේ ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලි අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට අටකුත් දශම හතක් (8.7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් එක්කෝටි විසිඅට ලක්ෂ හැත්තෑ දහස් තුන්සිය විසි අටකුත් ශත පනස් හතරක (රු. 1,28,70,328.54) මුදලක් සහ 2013 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පනස් හයලක්ෂ අනූනව දහස් නවසිය හැත්තෑ අටක් (රු. 56,99,978) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ;

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

මත පොළිය ද, රුපියල් විසිපන් ලක්ෂ හැට අට දහස් දෙසිය අනූදෙකක් (රු. 25,68,292) සඳහා එක් එක් මාසයේ ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට නවයක් (9%) ඉහල අනුපාතියක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, රුපියල් තිස්පන් ලක්ෂයක් (රු. 35,00,000) සඳහා එක් එක් මාසයේ ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට අටකුත් දශම හතක් (8.7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ ( විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 843, 1516 සහ 1747 දරන උකස් බැඳුම්කර මගින් එකී ෂන්මුගම් විග්නේස්වරන් විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම බලයලත් වෙන්දේසිකරුවන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 843, 1516 සහ 1747 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ත්‍රිකුණාමලය නගර සභා සීමාව ඇතුළත, අංක 7 පෙරුන්තෙරු නගර සභා කොට්ඨාසයේ පිහිටි ත්‍රිකුණාමලය, මහ වීදිය (මේන් ස්ට්‍රීට්) වරිපනම් අංක 323, 323/1, 323/2, 323/3, 325, 327, 327/1, 327/2 සහ 327/3 දරන හා බලයලත් මානක පී. මහේන්ද්‍රනාතන් විසින් සකස් කළ අංක 1866 හා 2008.06.15 දින දරන පිඹුරේ ලොට් 'ඒ' ලෙස ලකුණු කළ බිම් කට්ටියට මායිම්, උතුරට : කේ. ෂන්මුගම්ගේ උරුමකරුවන් හිමිකම් කියන දේපළ සහ මහවීදිය (මේන් ස්ට්‍රීට්) ද, නැගෙනහිරට : මහ වීදිය (මේන් ස්ට්‍රීට්) සහ ආචාර්ය/දොස්තර තම්බයියාගේ උරුමකරුවන් හිමිකම් කියන දේපළ ද, දකුණට : ආචාර්ය/දොස්තර තම්බයියාගේ උරුමකරුවන් සහ වරතකුමාර් හිමිකම් කියන දේපළ ද, බස්නාහිරට : වරතකුමාර් සහ ෂන්මුකම්ගම්ගේ උරුමක්කරුවන් හිමිකම් කියන දේපළ ද යන මායිම් ඇතුළත පර්චස් විසිතුනකුත් දශම අටක් (අ. 0, රූ. 0, පර්. 23.38) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එය හා සම්බන්ධ සියලු අයිතිවාසිකම් ද වේ.

ඉහත සඳහන් ඉඩම ත්‍රිකුණාමලයේ බලයලත් මානක පී. මහේන්ද්‍රනාතන් විසින් නැවත මනින ලදුව සකස් කරන ලද අංක 1866ඒ හා 2012.03.25 දින දරන පිඹුරේ ලොට් ''ඒ '' ලෙස නිරූපනය කර නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමල නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ත්‍රිකුණාමලය නගර සභා සීමාව ඇතුළත, අංක 7 පෙරුන්තෙරු නගර සභා කොට්ඨසායේ පිහිටි ත්‍රිකුණාමලය මහ වීදිය (මේන් ස්ට්‍රීට්) වරිපනම් අංක 323, 323/1, 323/2, 323/3, 325, 327, 327/1. 323/2 සහ 327/3 දරන උතුරට : කේ. ෂන්මුගම්ගේ උරුමකරුවන් හිමිකම් කියන දේපළ සහ මහ වීදිය (මේන් ස්ට්‍රීට්) ද, නැගෙනහිරට : මහ වීදිය (මේන් ස්ට්‍රීට්) සහ ආචාර්ය/දොස්තර තම්බයියාගේ උරුමක්කරුවන් හිමිකම් කියන දේපළ ද, දකුණට : ආචාර්ය/දොස්තර තම්බයියාගේ උරුමක්රුවන් සහ වරතකුමාර් හිමිකම් කියන දේපළ සහ බස්නාහිරට : වරතකුමාර් සහ ෂන්මුකම්ගම්ගේ උරුමකරුවන් හිමිකම් කියන දේපළ ද යන මායිම් ඇතුළත පර්චස් විසිතුනකුත් දශම තුනයි අටක් (අ. 0, රූ. 0, පර්. 23.38) බිම් ප්‍රමාණයෙන් යුත් පරිශ්‍රය සහ එහි පිහිටි වෙනත් සියලු දේ ලෙස විස්තර කර ඇත. මෙම ඉඩම ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

05-717

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2013 ඔක්තෝබර් මස 30 දින දී ඒක ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඒ. වී. විජේකෝන් විසින් ලියා සහතික කරන ලද අංක 465 හා 2010 ජූලි මස 29 වැනි දින දරන උකස් බැඳුම්කරය, අංක 466 හා 2010 ජූලි මස 29 දින දරන උකස් බැඳුම්කරය, අංක 467 හා 2010 ජූලි මස 29 දින දරන උකස් බැඳුම්කරය, අංක 468 හා 2010.07.29 දින දරන උකස් බැඳුම්කරය, අංක 655 හා 2012.05.14 දින දරන උකස් බැඳුම්කරය, අංක 656 හා 2012.05.14 දින දරන උකස් බැඳුම්කරය හා අංක 666 හා 2012.08.06 දින දරන උකස් බැඳුම්කරයන් යන සියලු උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, 1982 අංක 17 දරන සමාගම් පනත/1938 අංක 51 දරන සමාගම් ආඥාපනත යටතේ යථා පරිදි සංස්ථාගත කර තිබෙන ලියාපදිංචි අංක 14245 දරන සහ ලියාපදිංචි කාර්යාලය, මීගමුව, කටුවාපිටිය පාර, අංක 10/1 දරන ස්ථානයේ පිහිටා තිබෙන (මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) ඇක්වා හැචරිස් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2013 ජූලි මස 31 වැනි දිනට ඉහත කී අංක 465, 466, 467, 468, 655, 656 සහ 666 දරන උකස් බැඳුම්කර මත එකී ඇක්වා හැචරිස් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් පන්කෝටි හැත්තෑ දෙලක්ෂ දහනවදහස් නවසිය පනස් තුනකුත් ශත විසි දෙකක (රු. 5,72,19,953.22) මුදලක් සහ 2013 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්කෝටි හැත්තෑඅටලක්ෂ දහහත් දහස් හාරසිය තිස්හයකුත් ශත හතරක් (රු. 1,78,17,436.04) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී

ප්‍රතිශෝධනය කරන, මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන පාදක පොළී අනුපාතික අතරින් ප්‍රතිශෝධන දිනයේ දී පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට හතක (7%) ආන්තිකයක් එකතු කළ වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, රුපියල් හැට ලක්ෂයක් (රු. 60,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන, මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන පාදක පොළී අනුපාතික අතරින් ප්‍රතිශෝධන දිනයේ දී පැවති වඩා ඉහළ අනුපාතිකයට සියයට හතකුත් දශම පහක (7.5%) ආන්තිකයක් එකතු කළ වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, රුපියල් දෙකෝටි පනස් ලක්ෂයක් (රු. 2,50,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම මාසයකට ව්‍යාපර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, රුපියල් දහසය ලක්ෂ හැත්තෑනව දහස් තුන්සිය අසූහතරකුත් ශත තිහක් (රු. 16,79,384.30) සඳහා එක් එක් වර්ෂයේ සෑම මාසයකම ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට සියයට හතරක් (4%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් පන්කෝටි හැත්තෑ දෙලක්ෂ දහනවදහස් නවසිය පනස් තුනකුත් ශත විසි දෙකක (රු. 5,72,19,953.22) මුදල සහ 2013 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්කෝටි හැත්තෑඅටලක්ෂ දහහත් දහස් හාරසිය තිස්හයකුත් ශත හතරක් (රු. 1,78,17,436.04) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන පාදක පොළී අනුපාතික අතරින් ප්‍රතිශෝධන දිනයේ දී පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට හතක (7%) ආන්තිකයක් එකතු කළ වාර්ෂික අනුපාතිකය මත පොළිය ද,

රුපියල් හැට ලක්ෂයක් (රු. 60,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන, මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ;

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන පාදක පොළී අනුපාතික අතරින් ප්‍රතිශෝධන දිනයේ දී පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට හතකුත් දශම පහක (7.5%) ආන්තිකයක් එකතු කළ වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, රුපියල් දෙකෝටි පනස් ලක්ෂයක් (රු. 2,50,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම මාසයකම ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, රුපියල් දහසය ලක්ෂ හැත්තෑනව දහස් තුන්සිය අසූහතරකුත් ශත තිහක් (රු. 16,79,384.30) සඳහා එක් එක් වර්ෂයේ සෑම මාසයකම ව්‍යාපර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකය සියයට හතරක් (4%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය එහි පිහිටි ගොඩනැගිලි හා චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද සමග විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී 465, 466, 467, 468, 655, 656 සහ 666 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 465,466, 467, 468, 655, 656 සහ 666 දරන උකස් බැඳුම්කර මගින් එකී ඇක්වා හැචරීස් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය එහි පිහිටි ගොඩනැගිලි හා චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ ද සමග කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 465, 466 සහ 666 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, අලුත් කුරු කෝරළේ, දාසිය පත්තුවේ තුලාහේනේ පිහිටි "කිරිල්ලගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ආර්. ජයලත් විසින් මැන සකස් කරන ලද අංක 37/2009 හා 2009 ඔක්තෝබර් මස 31 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බිම්

කට්ටිය වූ උතුරට : ජෝසප් ප්‍රනාන්දු සහ තවත් අය හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : පාර ද, දකුණට : එල්. ප්‍රැන්සිස් සහ තවත් අය හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : මුහුදු වෙරළ ද යන මායිම් ඇතුළත අක්කර එකකුත් රූඩ් එකක් (අ. 1, රූ. 1, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වෙනත් සියලු දේ.

ඉහත සඳහන් අංක 37/2009 පිඹුරේ ලොට් අංක 1 ලකුණු කළ බිම් කට්ටිය මෙහි පහත විස්තර කරන ඉඩම නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, අලුත් කුරු කෝරළේ, දාසිය පත්තුවේ, තලාහේනේ අංක 258/8 හා 1977 මාර්තු මස 30 වැනි දින දරන *විශේෂ ගැසට් පත්‍රයට* අනුව බසියවත්තේ පිහිටි, කිරිල්ලගහවත්ත නොහොත් බසියවත්ත නැමැති ඉඩමේ ලොට් අංක 1 දරන බිම් කට්ටිය වූ සර්වේයර් ජනරාල්වරයාගේ අංක CO/2718 දරන පිඹුරට අනුව උතුරට : කිරිපියනගේ ජෝසප් ප්‍රනාන්දුගේ ඉඩම ද, නැගෙනහිරට : පාර ද, දකුණට : එල්. ප්‍රැන්සිස් ප්‍රානන්දුගේ කිරිල්ලගහවත්ත ද, බස්නාහිරට : මුහුදු වෙරළ ද යන මායිම් ඇතුළත අක්කර එකකුත් රූඩ් එකක් (අ. 1, රූ. 1, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි හා නිර්මිත සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C715/79 යටතේ සහ C985/99 හා C958/100 යටතේ ද ලියාපදිංචි කර තිබේ.

**අංක 467 සහ 468 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ විස්තරය**

ඒකල, ජා-ඇල කාර්මික සංවර්ධන මණ්ඩලයේ, කාර්මික කලාපයේ, බ්ලොක් අංක 10A දරන ස්ථානයේ පරිශ්‍රය තුළ සහ මත දැනට තිබෙන,

| | | | |
|---|---|---|---|
| 1. | යන්ත්‍රෝපකරණය | - | නවතම පින් මිල් ග්‍රයින්ඩිං සිස්ටම් කට්ටල 1 |
| | මොඩලය | - | මොඩල් පීඑම් - 3 උපාංග සමඟ |
| | උපාංග | - | අ. බ. 5 ඩ්‍රයිවිං මෝටරය, ෆීඩින් හොපර්, ඩිස්චාර්ජ් හොපර් |
| 2. | යන්ත්‍රෝපකරණය | - | නවතම රිබන් මික්සර කට්ටල 1 |
| | මොඩලය | - | මොඩල් ආර්එම් 100 උපාංග සමග |
| | උපාංග | - | අ. බ. 2 ගියර් රෙඩියුස් මෝටරය, "U" බැරලය, ස්ප්‍රේ යුනිට් |

ඇතුළුව සම්පූර්ණ චංචල පරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංග හා මෙවලම් හා සමාගම විසින් දැනට සහ මින් ඉදිරියට කවර හෝ අවස්ථාවක හෝ කලින් කළ ව්‍යාපාරය කරගෙන යන සහ කලින් කල ව්‍යාපාරය කරගෙන යනු ලැබිය හැකි පරිශ්‍රයක් තුළ හෝ මත සහ එම චංචල පරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ කලින් කල ගබඩාකර තබා හෝ තැන්පත් කර තබනු ලබන යම් පරිශ්‍රවල තිබෙන සහ එකී චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංග සහ මෙවලම් වෙනුවට ප්‍රතියෝජනය කරනු ලැබීම සඳහා ඉහත කී පරිශ්‍රවලට වරින්වර හා සෑම කල්හිම ගෙනඑනු ලබන, ඒවායේ තැන්පත් කරනු ලබන හෝ දමනු ලබන හා එකී ගුදම්, ගබඩා සහ පරිශ්‍රවල තිබෙන සමාගම් සියලු චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංග සහ මෙවලම් හෝ සමාගම විසින් එහි ව්‍යාපාරය හෝ කර්මාන්තය යම් අවස්ථාවක හෝ කලින් කල ඉවත් කරගෙන යනු ලබන වෙනත් කවර හෝ ස්ථානයක තිබෙන හෝ ගුදම්, ගබඩා හෝ පරිශ්‍රවල තබා තිබෙන සමාගමේ එකී සියලු චංචල පරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංග සහ මෙවලම් වේ.

**අංක 655 සහ 656 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ විස්තරය**

ත්‍රිකුණාමලය, ඉන්ඩස්ට්‍රියල් පාක්, බ්ලොක් අංක 18 දරන ස්ථානයේ පරිශ්‍රය තුළ සහ මත දැනට තිබෙන-

| *යන්ත්‍රෝපකරණ විස්තරය* | *පිරිවිතර* | *ප්‍රමාණය* |
|---|---|---|
| බ්ලාස්ට් ෆ්‍රීසර් | ඔපරේටිං ටෙම්පරේචර් 35°c දක්වා<br>නිෂ්පාදනය - ඇමරිකා එක්සත් ජනපදය | 2 |
| ෆ්ලේක් අයිස් මැෂින් | ධාරිතාව - පැය 24/මෙට්‍රික් ටොන් 5<br>නිෂ්පාදනය - ඇමරිකා එක්සත් ජනපදය | 1 |
| ප්ලේට් ෆ්‍රීසර් | ධාරිතාව - ස්ටේෂන්, 6, 48"x60"x7/8" ප්ලේට්ස්<br>නිෂ්පාදනය - ඇමරිකා එක්සත් ජනපදය | 1 |
| කම්ප්‍රෙසර් | ධාරිතාව - අ. බ. 25<br>නිෂ්පාදනය - ඇමරිකා එක්සත් ජනපදය | 1 |
| කන්ඩෙන්සිං යුනිට් | ධාරිතාව - අ. බ. 15, උෂ්ණත්වය 20.5°c දක්වා | 1 |
| කෝල්ඩ් ස්ටෝර් රූම්ස් | ධාරිතාව - මෙට්‍රික් ටොන් 250ක් දක්වා<br>ගබඩා කිරීම<br>උෂ්ණත්වය 20°c සිට 25°c දක්වා | 2 |

ඇතුළුව සම්පූර්ණ චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංග හා මෙවලම් හා සමාගම විසින් දැනට සහ මින් ඉදිරියට කවර හෝ අවස්ථාවක හෝ කලින්කල ව්‍යාපාරය කරගෙන යන සහ කලින්කල ව්‍යාපාරය කරගෙන යනු ලැබිය හැකි පරිශ්‍රයක් තුළ හෝ මත සහ එම චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ කලින්කල ගබඩාකර තබා හෝ තැන්පත් කර තබනු ලබන යම් පරිශ්‍රවල තිබෙන සහ එකී චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංග සහ මෙවලම් වෙනුවට ප්‍රතියෝජනය කරනු ලැබීම සඳහා ඉහත කී පරිශ්‍රවලට වරින්වර හා සෑම කල්හිම ගෙනඑනු ලබන, ඒවායේ තැන්පත් කරනු ලබන හෝ දමනු ලබන හා එකී ගුදම්, ගබඩා සහ පරිශ්‍රවල තිබෙන සමාගමේ සියලු චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංග සහ මෙවලම් හෝ සමාගම විසින් එහි ව්‍යාපාරය හෝ කර්මාන්තය යම් අවස්ථාවක හෝ කලින් කල ඉවත් කරගෙන යනු ලබන වෙනත් කවර හෝ ස්ථානයක තිබෙන හෝ ගුදම්, ගබඩා හෝ පරිශ්‍රවල තබා තිබෙන සමාගමේ එකී සියලු චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංග සහ මෙවලම් වේ.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

05-718

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්ති යටතේ කරනු ලබන දැනුම්දීම

2014.03.24 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ජී. විජේසිංහ විසින් සහතික කරන ලද 2013.02.01 දිනැති අංක 605 දරන උකස් බැඳුම්කරයට අනුව 2014.01.24 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් පනස් පන්ලක්ෂ දහහත් දහස් පන්සිය තිස් අටයි ශත හතක (රු. 55,17,538.07) මුදල සමග රුපියල් පනස් දෙලක්ෂ හතලිස් හතර දහස් අටසිය අසූ දෙකයි ශත අනූවක (රු. 52,44,882.90) මුදල මත වසරකට සියයට දහඅටයි දශම පහ (18.5%) බැගින් පොළියක් 2014.01.25 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් බත්තරමුල්ල කර්නල් සුමිත් ධම්මික පෙරේරා මාවත, අංක 772/1D හි පදිංචි දික්කුඹුරගේ උපුල් ෂර්ලි ඥානරත්න මහතා සහ අත්වැල් ගමරාලලාගේ හේමචන්ද්‍ර විජේරත්න මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. 2013.02.01 දිනැති එකී අංක 605 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් පනස් පන් ලක්ෂ දහහත් දහස් පන්සිය තිස් අටයි ශත හතක (රු. 55,17,538.07) මුදල සමග 2014.01.25 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තියට යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුවේ, වැල්ලවත්ත ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උකස් බැඳුම්කරයෙහි සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලෙ පත්තුවේ, තලංගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුවෙල මහ නගර සභා සීමාවේ බත්තරමුල්ල පිහිටි පන්නිපිටිය පාරේ, වරිපනම් අංක 61/14 දරන "හිග්ගහවත්ත නොහොත් ගොඩැල්ලහේන' (එහෙත් ගොඩැල්ලහේන ලෙස ලියාපදිංචි කර ඇති) නමැති ඉඩමට එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් විසින් සාදන ලද 1994 ජූනි මස 3 දිනැති අංක 1217 දරන පිඹුරෙහි ලොට් A2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2A උතුරට : පාර ද, නැගෙනහිරට : පිඹුරු අංක 629හි ලොට් 3, 11 සහ ලොට් 2B ද, දකුණට : ලොට් 2B ද, බස්නාහිරට : පාර ද මායිම්ව එකී අංක 1217 දරන පිඹුරට අනුව පර්චස් දාහතරක (අ. 0, රූ. 0, පර්. 14) බිම් ප්‍රමාණයකින් සමන්විතවන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි B215/03හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු එස්. ජී. රණසිංහ විසින් මෑතක දී සාදන ලද 1995 දෙසැම්බර් මස 15 දිනැති අංක 212 දරන මැනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී බත්තරමුල්ල පිහිටි "හිග්ගහලන්ද නොහොත් ගොඩැල්ලහේන" නමැති ඉඩමේ එහි ඇති ගහකොළ, ගොඩනැගිලි හා වෙනත් සියලු දේ ද ඇතුළත් වූ එකී අංක 212 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : පාර ද, නැගෙනහිරට : පිඹුරු අංක 629හි ලොට් 3 හා 11 පාර (අඩි 15 පළල) සහ පිඹුරු අංක 1217හි ලොට් 2B ද, දකුණට : පිඹුරු අංක 1217 හි ලොට් 2B ද, බස්නාහිරට : පාර ද මායිම් ව එකී අංක 212 දරන පිඹුරට අනුව පර්චස් දාහතරක (අ. 0, රූ. 0, පර්. 14) බිම් ප්‍රමාණයකින් සමන්විත වේ.

එකී බිම් කැබැල්ල බලයලත් මිනින්දෝරු එස්. ජී. රණසිංහ විසින් මෑතකදී සාදන ලද 2011 මාර්තු මස 24 දිනැති අංක 3674 දරන මැනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී බත්තරමුල්ලෙහි පිහිටි "හිග්ගහලන්ද නොහොත් ගොඩැල්ලහේන" නමැති ඉඩමේ එහි ඇති ගහකොළ, ගොඩනැගිලි හා වෙනත් සියලු දේ ඇතුළත් වූ අංක 3674 දරන පිඹුරෙහි ලොට් A ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් A උතුරට : ඉන්ද්‍රජෝති මාවතෙහි පළමු පටුමග ද, නැගෙනහිරට : පිඹුරු අංක 629හි ලොට් 3 හා පිඹුරු අංක 1217 හි ලොට් 2B (ඉන්ද්‍රජෝති මාවතේ වරිපනම් අංක 61/15 සහ 61/17 දරන පරිශ්‍රයන්) සහ ඉන්ද්‍රජෝති මාවතේ 2 වන පටුමග ද, දකුණට : ඉන්ද්‍රජෝති මාවතෙහි වරිපනම් අංක 61/17 දරන පරිශ්‍රය පිඹුරු අංක 1217හි ලොට් 2B ද, බස්නාහිරට : ඉන්ද්‍රජෝති මාවතෙහි 1 වැනි පටුමග ද මායිම්ව එකී අංක 3674 දරන පිඹුරට අනුව පර්චස් දාහතරක (අ. 0, රූ. 0, පර්. 14) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජේ. ඥාණසම්බන්ධන් මිය,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී.

ලංකා බැංකුව,
වැල්ලවත්ත.

05-731

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2014.04.07 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක විසින් සහතික කරන ලද 2011.11.30 දිනැති අංක 2170 දරන උකස් බැඳුම්කරය අනුව 2013.12.02 දින තෙක් මුදල් මුදල හා පොළිය වශයෙන් රුපියල් එක්කෝටි හතලිස් හත්ලක්ෂ පනස් හතර දහස් දෙසිය හතලිහයි ශත විසි හයක (රු. 14,754,240.26) මුදල සමග රුපියල් එක්කෝටි තිස්එක් ලක්ෂ පනස්පත් දහස් හත්සිය දාහතරයි ශත තුනක (රු. 13,155,714.03) මුදල මත වසරකට සියයට දහතුනයි දශම හයයි එකක් (13.61%) බැගින් පොළියක් 2013.12.03 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් නාගොල්ලාගොඩ, කෝන්කඩවල, අරුනාලෝක කොහු මෝල යන ලිපිනයෙහි පදිංචි සෝමවීර හේමචන්ද්‍රගේ අනුර ගාමිණී ප්‍රේමසිරි මහතා සහ රත්නසිරි හේවගේ ශ්‍රියංකා දමයන්ති මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. 2011.11.03 දිනැති එකී අංක 2170 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් එක්කෝටි හතලිස් හත්ලක්ෂ පනස් හතර දහස් දෙසිය හතලිහයි ශත විසි හයක (රු. 14,754,240.26) මුදල සමග 2013.12.03 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා

බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කුරුණෑගල, මල්කඩුවාව, තල්ගොඩපිටිය මාවත, අංක 33හි පදිංචි වෙන්දේසිකාර එච්. ඩබ්. අශෝක ජයලාල් මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුවේ, හෙට්ටිපොල ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු/අයකර ගැනීමේ නිලධාරී හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කරඳාපත්තු කෝරළේ, කටුගම්පොල හත්පත්තුවේ, බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාවේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 1429 දරන කෝන්කඩවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කෝන්කඩවල ග්‍රාමයේ පිහිටි මීගහමුලවත්ත, කොස්ගහමුලවත්ත, කෝන්ගහමුලවත්ත සහ කහටගහමුලවත්ත (කෝන්ගහමුලවත්ත සහ කහටගහමුලවත්ත ලෙස ලියාපදිංචි කර ඇති) ඉඩමෙහි බලයලත් මිනින්දෝරු ඒ. අතපත්තු විසින් සාදන ලද 1988.01.29 දිනැති අංක 61/87 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 ඊසාන දිගට : එච්. පී. රත්නපාල උරුමකම් කියන ඉඩම ද, නැගෙනහිරට : ජේ. කේ. සෙනෙවිරත්න සහ වෙනත් අය උරුමකම් කියන කුඹුර ද, දකුණට : පියදාස උරුමකම් කියන ඉඩම, එම්. පී. බණ්ඩියා උරුමකම් කියන ඉඩම සහ උස් වැව සිට හමන්පහුව දක්වා ගම්සභා පාර ද, බස්නාහිරට : කේ. පී. විමලසේන උරුමකම් කියන ඉඩම ද, වයඹට : එච්. පී. අබේරත්න උරුමකම් කියන ඉඩම ද මායිම්ව අක්කර තුනයි රූඩ් තුනයි පර්චස් බිංදුවයි දශම දෙකක (අ. 3, රූ. 3, පර්. 0.2) බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර එහි ඇති ගහකොළ සහ සියලු දේ ද සමග වේ. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M144/70 හි ලියාපදිංචි කර ඇත.

ඉහත උපලේඛනය නිවැරදිය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එම්. යූ. අත්තනපොල මහතා,
කළමනාකරු.

2014 අප්‍රේල් මස 10 වැනි දින,
ලංකා බැංකුව,
හෙට්ටිපොල.

05-730

---

### පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : රෂ්නා බදුර්ඩීන් සහ මොහිදීන් රිෆ්කි බදුර්ඩීන්

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.04.20 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, රෂ්නා බදුර්ඩීන් සහ මොහිදීන් රිෆ්කී බදුර්ඩීන් විසින් කලින් පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පීකිව් 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. මධුමාලී අල්විස් විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.09.30 දිනැති අංක 209 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය, වර්ෂ 2013.09.02 දිනැති අංක 195 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ වර්ෂ 2013.09.30 දිනැති අංක 211 දරන ද්විතියික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 209, 195 සහ 211 දරන උකස් බැඳුම්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2014.02.28 දින දක්වා මුල් මුදල සහ පොළිය ද, වශයෙන් රුපියල් පහළොස් මිලියන තුන්සිය හතලිස් එක් දහස් එකසිය හැත්තෑ එකයි ශත හැට එක (රු. 15,341,171.61) ක මුදල සහ 2014.03.01 වැනි දින සිට රුපියල් මිලියන පහලව (රු. 15,000,000) ක මුදල් සීමාව දක්වා වාර්ෂිකව 14% බැගින් පොළිය ද සහ රුපියල් මිලියන පහලොව (රු. 15,000,000) ක මුදල ඉක්මවා යන මුදල මත වාර්ෂිකව 24% බැගින් පොළිය ද,

සහ

2014.03.12 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දෙසිය විසි දෙක් මිලියන අසූ දහස් පන්සිය අසූ එකයි ශත අසූ අට (රු. 222,080,581.88) ක මුදල සහ 2014.03.13 වැනි දින සිට රුපියල් දෙසිය පහළොස් මිලියනය (රු. 215,000,000) ක මුදල මත වර්ෂයකට සියයට දහසය (16%) බැගින් පොළිය ද පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ, ඒ කෙසේ ද යත්,

එකී අංක 209, 195 සහ 211 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් දෙසිය තිස් හත් මිලියන හාරසිය විසි එක් දහස් හත්සිය පනස් තුනයි ශත හතලිස් නවය (රු. 237,421,753.49) ක මුදල, ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134 දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර පී. කේ. ඊ. සේනාපති වෙත එකී 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස ය.

#### අංක 209 දරන උකස්කරය යටතේ වූ ඉහත සඳහන් උපලේඛණය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ/නුගේගොඩ ලියාපදිංචි කිරීමේ සීමාව ඇතුළත) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව ඇතුළත, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිකඩ නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 514හි මැදවැලිකඩ, කමතවත්ත පාර, වරිපනම් අංක 208 (කොටසක්) වන (බලයලත් මානක සී. ද එස්. ගුණතිලක විසින් සකසන ලද අංක 3222 සහ 2004.03.23 දිනැති පිඹුරේ ලොට් 1හි අතුරු බෙදීමක් වන) බලයලත් මානක කේ. වී. එම්. ඩබ්. සමරනායක විසින්

සකසන ලද අංක 2230 සහ 2004.07.15 දිනැති පිඹුරේ ලොට් අංක 1ඒ දරන කමතවත්ත නමැති ඉඩම වන එකී ලොට් අංක 1ඒ, උතුරට : ලොට් 1එච් ද, නැගෙනහිරට : ලොට් 1බී ද, දකුණට : කමතවත්ත පාර සහ බස්නාහිරට : එන්. ඒ. ජී. ඩබ්. පෙරේරාගේ ඉඩම ද මායිම් වූ එකී පිඹුරු අංක 2230ට අනුව ප්‍රමාණයෙන් පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20)ක් හෝ හෙක්ටෙයාර් 0.0506ක් වන ඉඩම සමග ඒ මත වූ ගොඩනැගිල්ල, ගහකොළ සහ සියල්ලම ද සමග දෙල්කඳ/නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු ඒ 150/96හි ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (දෙල්කඳ/නුගේගොඩ ලියාපදිංචි කිරීමේ සීමාව ඇතුළත) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව ඇතුළත, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිකඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 514හි මැදවැලිකඩ, කමතවත්ත පාර, වරිපනම් අංක 208 (කොටසක්) වන (බලයලත් මානක සී. ද එස්. ගුණතිලක විසින් සකසන ලද අංක 3222 සහ 2004.03.23 දිනැති පිඹුරේ ලොට් 1හි අතුරු බෙදීමක් වන) බලයලත් මානක කේ. වී. එම්. ඩබ්. සමරනායක විසින් සකසන ලද අංක 2230 සහ 2004.07.15 දිනැති පිඹුරේ ලොට් අංක 1බී දරන කමතවත්ත නමැති ඉඩම වන එකී ලොට් අංක 1බී, උතුරට : ලොට් 1ජී ද, නැගෙනහිරට : ලොට් 1සී ද, දකුණට : කමතවත්ත පාර සහ බස්නාහිරට : ලොට් අංක 1ඒ ද මායිම් වූ, එකී පිඹුරු අංක 2230ට අනුව ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) හෝ හෙක්ටයාර් 0.0506ක් වන ඉඩම සමග ඒ මත වූ ගොඩනැගිල්ල, ගහකොළ සහ සියල්ලම ද සමග දෙල්කඳ/නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු ඒ 150/98හි ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (දෙල්කඳ/නුගේගොඩ ලියාපදිංචි කිරීමේ සීමාව ඇතුළත) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව ඇතුළත, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිකඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 514හි මැදවැලිකඩ, කමතවත්ත පාර, වරිපනම් අංක 208 (කොටසක්) වන (බලයලත් මානක සී. ද එස්. ගුණතිලක විසින් සකසන ලද අංක 3222 සහ 2004.03.23 දිනැති පිඹුරේ ලොට් 1හි අතුරු බෙදීමක් වන) බලයලත් මානක කේ. වී. එම්. ඩබ්. සමරනායක විසින් සකසන ලද අංක 2230 සහ 2004.07.15 දිනැති පිඹුරේ ලොට් අංක 1එච් දරන කමතවත්ත නමැති ඉඩම වන එකී ලොට් අංක 1එච්, උතුරට : දිය වන්නා ඔය ද, නැගෙනහිරට : ලොට් 1ජී ද, දකුණට : ලොට් අංක 1ඒ සහ බස්නාහිරට : එන්. ඒ. ජී. ඩබ්. පෙරේරාගේ ඉඩම ද මායිම් වූ, එකී පිඹුරු අංක 2230ට අනුව ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම නමය (අ. 0, රූ. 0, පර්. 3.9) ක් හෝ හෙක්ටෙයාර් 0.0099ක් වන ඉඩම සමග ඒ මත වූ ගොඩනැගිල්ල, ගහකොළ සහ සියල්ලම ද සමග දෙල්කඳ/නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු ඒ 150/97හි ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

4. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (දෙල්කඳ/නුගේගොඩ ලියාපදිංචි කිරීමේ සීමාව ඇතුළත) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව ඇතුළත, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිකඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 514හි මැදවැලිකඩ, කමතවත්ත පාර, වරිපනම් අංක 208 (කොටසක්) වන (බලයලත් මානක සී. ද එස්. ගුණතිලක විසින් සකසන ලද අංක 3222 සහ 2004.03.23 දිනැති පිඹුරේ ලොට් 1හි අතුරු බෙදීමක් වන) බලයලත් මානක කේ. වී. එම්. ඩබ්. සමරනායක විසින් සකසන ලද අංක 2230 සහ 2004.07.15 දිනැති පිඹුරේ ලොට් අංක 1ජී දරන කමතවත්ත නමැති ඉඩම වන එකී ලොට් අංක 1ජී, උතුරට : දිය වන්නා ඔය ද, නැගෙනහිරට : ලොට් 1එෆ් ද, දකුණට : ලොට් අංක 1බී සහ බස්නාහිරට : ලොට් අංක 1එච් ද මායිම් වූ එකී පිඹුරු අංක 2230ට අනුව ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම එක (අ. 0, රූ. 0, පර්. 4.1) ක් වූ හෝ හෙක්ටයාර් 0.0104ක් වන ඉඩම සමග ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ සියල්ලම ද සමග දෙල්කඳ/නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු ඒ 150/98හි ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

### උකස්කර අංක 195 සහ 211 යටතේ වූ ඉහත සඳහන් උපලේඛනය

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කොට්ඨාසය ඇතුළත) අළුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 83-පල්ලියපිටිය බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, ඉහළ මඩම්පැල්ල සහ පහළ මඩම්පැල්ල ග්‍රාමයන්හි, කෙහෙල්ඇල්ල පල්ලියපිටිය හි පිහිටි (බලයලත් මානක එම්. ජේ. සේතුංග විසින් සකසන ලද අංක 2865 සහ 1989 නොවැම්බර් මස 20 දිනැති පිඹුරෙහි දක්වා ඇති ලොට් අංක 5, 6. 7 සහ 8 සංසර්ජනය කොට අතුරු බෙදීමක් වන) බලයලත් මානක ඩබ්. ලක්ෂ්මන් එච් ප්‍රනාන්දු විසින් සකසන ලද අංක 8537 සහ 2008 සැප්තැම්බර් මස 28 වැනි දිනැති පිඹුරේ ලොට් අංක 1 වශයෙන් දක්වා ඇති දැනට ශාන්ත ජෝශප්ස් ග්‍රෑප් හෙවත් හොරකැලේ එස්ටේට් යනුවෙන් නම්කර හඳුන්වනු ලබන එකම දේපළක් වශයෙන් සැකසී ඇති දන්ගහලන්ද, ඇහැළගහලන්ද, හොරකැලේ, දෙල්ගහවත්ත, දවටගහවත්ත සහ දන්ගොල්ල නමැති ඉඩමේ එකී ලොට් අංක 01ට මායිම් උතුරට : එම ඉඩමෙහිම ඉතිරි කොටස ද, නැගෙනහිරට : එම ඉඩමෙහිම ඉතිරි කොටස ද, දකුණට : පාර ද (ප්‍රාස) සහ බස්නාහිරට : එම ඉඩමෙහිම ඉතිරි කොටස ද වූ එකී අංක 8537 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර පහ (අ. 5, රූ. 0, පර්. 0) හෝ (හෙක්ටෙයාර් 2.02343)ක් වන ඉඩම එහි පස, ගහකොළ, ගොඩනැගිලි සහ ඒ මත වූ අනෙකුත් සියළුම දේත් සමග වූ මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම ජේ 26/22හි ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කොට්ඨාසය ඇතුළත) අළුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 83-පල්ලියපිටිය බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, ඉහළ මඩම්පැල්ල සහ පහළ මඩම්පැල්ල ග්‍රාමයන්හි, කෙහෙල්ඇල්ල පල්ලියපිටිය හි පිහිටි (බලයලත් මානක එම්. ජේ. සේතුංග විසින් සකසන ලද අංක 2865 සහ 1989 නොවැම්බර් මස 20 දිනැති පිඹුරෙහි දක්වා ඇති ලොට් අංක 5, 6, 7 සහ 8 හි ඉතිරි කොටස සහ බලයලත් මානක ඩබ්. විතාරන විසින් සකසන ලද අංක එන් 4684ඒ දරන 2004 මැයි මස 18 වැනි දිනැති පිඹුරේ ලොට් 10 වශයෙන් දක්වා ඇති සම්පූර්ණ ඉඩමවූ) සහ බලයලත් මානක ඩබ්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු විසින් සකසන ලද අංක 8557 සහ 2008 ඔක්තෝබර් 09 වැනි දිනැති පිඹුරේ ලොට් අංක 01 වශයෙන් දක්වා ඇති දැනට ශාන්ත ජෝශප්ස් ග්‍රෑප් හෙවත් හොරකැලේ එස්ටේට් යනුවෙන් නම්කර හඳුන්වනු ලබන එකම දේපළක් වශයෙන් සැකසී ඇති දන්ගහලන්ද, ඇහැළගහලන්ද, හොරකැලේ, දෙල්ගහවත්ත, දවටගහවත්ත සහ දන්ගොල්ල නැමති ඉඩමේ එකී ලොට් අංක 01ට මායිම් උතුරට : චන්ද්‍රපාල ජයසිංහගේ ඉඩම, ඇල සහ ඒ. අප්පුගේ සහ තවත් අයගේ කුඹුර ද, නැගෙනහිරට : බලයලත් මානක ඩබ්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු විසින් සකසන ලද එකී අංක 8537 දරන පිඹුරෙහි ලොට් 01, සුමනරත්නගේ කුඹුර, විලියම් අප්පුහාමි සහ අනෙකුත් අයගේ කුඹුර, වේලප්පුගේ උරුමක්කාරයින්ගේ ඉඩම, බලයලත් මානක එම්. ජේ. සේතුංග විසින් සකසන ලද අංක 2865 පිඹුරෙහි ලොට් 04, බලයලත් මානක ඩබ්. විතාරන විසින් සකසන ලද අංක 4684 පිඹුරෙහි ලොට් 2-2/2 ද, දකුණට : පාර (ප්‍රාස), බලයලත් මානක ඩබ්. විතාරණ විසින් සකසන ලද අංක 4684 පිඹුරෙහි ලොට් 01 සහ පාර (ප්‍රාස) සහ බස්නාහිරට : ගොඩිගමුව සිට දූනගහ දක්වාවූ (මාසංඅ) පාර, බලයලත් මානක ඩබ්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු විසින් සකසන ලද එකී අංක 8537 දරන පිඹුරේ ලොට් 1 ද මායිම් වූ එකී අංක 8557 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර පනස් පහයි රූඩ් එකයි පර්චස් දාහතක් (අ. 55.,

රූ. 1, පර්. 17) ක් හෝ (හෙක්ටෙයාර් 22.40188)ක් වන ඉඩම එහි පස, ගහකොළ, ගොඩනැගිලි සහ ඒ මත වූ අනෙකුත් සියළුම දේත් සමග වූ මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම ජේ 33/39 යටතේ ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ධර්මරත්නම්,
කළමනාකරු - අයකර ගැනීම්.

05-759

---

පීවීඑස් 1319.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1938 අංක 17 දරන සමාගම් ආඥාපනතේ විධිවිධාන යටතේ 1953.10.02 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2014 අප්‍රේල් මස 30 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

05-741

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.